# අහිංසාගේ සත්ව කරුණාව



ඉසලි අභිමානි කුමාරි මාන්නප්පෙරුම

# අහිංසාගේ සත්ව කරුණාව

ඉසලි අභිමානී කුමාරි මාන්නප්පෙරුම

(කතෘ)

කතෘගේ වෙනත් කෘති : මල්වලට පාට ලැබුණු හැටි (2025)

මහාමායා බාලිකා විදුහල

3 –E ශ්‍රේණිය

2026.05.10

ISBN- 978-624-211-039-4

# පිදුම

මාගේ ආදරණීය දෙමාපියන්ටත්,

ගුරුමෑණිවරුන් සහ ගුරුපියවරුන්ටත්

මෙම පොත් පිංචය

සෙනෙහසින් යුතුව

පිලිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

දසුනි කියන්නේ හරිම කරුණාවන්ත අහිංසක පුංචි ගැහැණු ළමයෙක්. එයාගේ කරුණාවන්තකම නිසාම එයාට පුංචි කාලේ ඉඳලා හැමෝම කතා කරේ “අහිංසා” කියලා. අහිංසා හැමදාම පාසල් ගියේ පයින්. ඉතිං එයා පුංචි කාලේ පටන්ම ගෙදර ඉඳලා ඉස්කෝලෙට යනකම්ම පාරේ ඉන්න බල්ලෝ, පූසෝ, ලේන්නු, කුරුල්ලෝ වගේ සත්තුන්ට කෑම දිදී ගියා. දැන් පාරේ ඉන්න හැම සතෙක්ම අහිංසා එක්ක හරි යාලුයි. අහිංසා උදේට කෑම ගේනකල් සත්තු බලාගෙන ඉන්නවා.



ඒත් අහිංසාගේ මල්ලී සත්තුන්ට කැමති වුනේ නෑ. එයා නිතරම සතුන්ට හිරිහැර කළා.



එක දවසක් අහිංසා, මල්ලිත් එක්ක පාසල් ඇරිලා ගෙදර එද්දී පුංචි බලු පැටියෙක් පාරේ කෑ ගසමින් ඉන්නවා ඔවුන් දැක්කා. අහිංසා බලු පැටියා ළගට ගිහින් බැලුවා. බලු පැටියා බඩගින්නේ ඉන්නේ කියලා අහිංසාට තේරුණා. ඒ වගේම බලු පැටියාගේ කකුලේ තුවාලයක් තියනවා අහිංසා දැක්කා. අහිංසාට ගොඩාක් දුක හිතුණා.

එයා මල්ලිට කතා කරලා බලු පැටියා ගෙදර අරන් යමුද කියලා ඇහුවා.

“අපෝ මම නම් කැමති නෑ. ඒ බලු පැටියා හරිම කැතයි, ගෙදර නම් ගෙනියන්න එපා”

මල්ලී කීවා.

මල්ලී එක පාරටම බලු පැටියාට ගහලා එලවා ගත්තා. අහිංසාට ගොඩාක් දුක හිතුණා. එයා අඩ අඩා ගෙදර ආවා.

මල්ලී අක්කාට විහිලු කරමින් හිනා වෙවී ගෙදර ආවා. එක පාරම ගලක හැප්පුනු මල්ලී ඇදගෙන වැටුනා. එයාගේ කකුල තුවාල වුණා. ලේ ගලන්න පටන් ගත්තා.



“මගේ කකුල හොදටම රිදෙනවා....”

කියමින් මල්ලී  අඬන්න ගත්තා. අහිංසා ඉක්මනින් මල්ලී නැගිටවලා කකුල සෝදලා මල්ලීගේ අතින් අල්ලා ගෙන ගෙදර එක්කන් ගියා. ගෙදර ගිහින් මල්ලීගේ තුවාලයට බෙහෙත් දැම්මා. මල්ලී කකුල රිදෙනවා කියලා අඬන්න ගත්තා. අක්කාට මල්ලී ගැන දුක හිතුනා. ඒත් එක්කම අහිංසාට අර පාරේ හිටපු බලු පැටියා මතක් වුණා. බලු පැටියාගේ කකුලේත් තුවාලයක් තිබුනනේ ඌට බෙහෙත් දාන්න කවුරුවත් නැනේ කියලා එයාට මතක් වුණා.



ඊලග දවසේ උදේ අභිංසයි, මල්ලියි පාසල් යද්දී අර බලු පැටියා කෙදිරි ගාමින් එයාලා ලගට ආවා. අභිංසා එයා ගෙනාව කෑම ටික බලු පැටියාට දුන්නා. එතකොටම මල්ලී බලු පැටියා එලවා දැම්මා. අභිංසාට ගොඩාක් දුක හිතුනා. එයා මල්ලිට මෙහෙම කීවා.

“ මල්ලී සත්තුන්ට කරදර කරන්න එපා. එයාලටත් අපිට වගේම රිදෙනවා. ඊයේ ඔයා වැටිලා ඔයාට ගොඩක් රිදුනා නේද? ඉතින් සත්තුන්ටත් ඒ වගේමයි. අර බලු පැටියාටත් උගේ තුවාලෙ රිදෙනවා ඇති, ඒකයි ඌ කෙදිරි ගාන්නේ” .



මල්ලී ටික වෙලාවක් කල්පනා කරා. මල්ලීටත් බලු පැටියා ගැන දුක හිතුනා. එයා අක්කාගෙන් සමාව ගත්තා. මීට පස්සේ කිසිම දවසක සතුන්ට කරදර කරන්නේ නැහැ කියලා මල්ලී අක්කාට පොරොන්දු වුණා. ඒ දෙන්නා ගෙනාව කෑම ටික බලු පැටියාට දුන්නා. බලු පැටියා බඩගින්නේ හිටිය නිසා කෑම ටික ඉක්මනින් ඉක්මනින් කෑවා.



බලු පැටියා ගෙදර අරන් යමු කියලා අභිංසා මල්ලීට යෝජනා කළා. ඔවුන් බලු පැටියා ගෙදර අරන් ගිහින් හොදින් නාවලා තුවාල වලට බෙහෙත් දැම්මා. ඊට පස්සේ ඌට හොදින් කන්න බොන්න දුන්නා. බලු බැටියාට “ජිමි” කියලා නමකුත් දැම්මා. ජිමි ඒ ගෙදර හොදින් වැඩෙමින් ගෙදරට ආරක්ෂාව ලබා දුන්නා.



අක්කා සහ මල්ලිට සෙල්ලම් කරන්න ජිමීව නැතිවම බැරිවුණා. ඉස්කෝලේ ගිහිං ඇවිත් හැමදාම හවසට ජිමී එක්ක සෙල්ලම් කළා.



එක දවසක් හවසක මල්ලී තනියම මිදුලේ සෙල්ලම් කරමින් හිටියා.



එක පාරම බලු පැටියා හයියෙන් බුරමින් මල්ලිගේ කමිසයෙන් අදින්න ගත්තා. සෙල්ලම් කරමින් සිටි මල්ලී වටපිට බැලුවා. එයා ළගම සර්පයෙක් ඉන්නවා දැකලා එකපාරම කෑ ගහමින් දිව්වා. මල්ලිගේ කෑගැහිල්ලට අක්කාත් දුවගෙන ආවා. මල්ලි තමන් ළගට ආපු සර්පයා අක්කාට පෙන්නුවා. බලු පැටියා තමන්ව බේරා ගත් හැටි අක්කාට කීවා. බලු පැටියාගේ වීර ක්‍රියාව ගැන එයාලට හරිම සතුටුයි. බලු පැටියා නිසා මල්ලීගේ ජීවිතය බේරුණා.



සතෙකුට උනත් අපි ආදරෙන්, කරුණාවෙන් සළකන විට එයාලත් අපිට උදව් කරනවා කියලා අක්කා මල්ලීට පැහැදිලි කළා. එදා ඉඳලා කිසිම දවසක මල්ලී කිසිම සතෙකුට කරදර කළේ නෑ. එයා හැම සතෙකුටම ආදරය කළා. පුළුවන් හැම වෙලාවකම සත්තුන්ට කන්න බොන්න දුන්නා. ඒ වගේම ගෙදර ඉන්න බලු පැටියාටත් ගොඩාක් ආදරය කළා. ඉතින් යාළුවනේ අපිත් කිසිම දවසක සතුන්ට කරදර, හිරිහැර නොකරමු. සතුන්ට ආදරය, කරුණාව දක්වමු. එවිට සතුන්ද අපට ආදරය, ආරක්ෂාව ලබා දෙනවා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN ISBN- 978-624-211-039-4